අවසාන වාර පරීක්ෂණය - www.eduLanka.lk
6 ශ්‍රේණිය නර්තනය කාලය පැය 2 යි.

1 කොටස

1. උඩරට නර්තන සම්ප්‍රදායේ පළමුවෙන්ම නර්තනය කරනු ලබන්නේ ………………………….. සරඹයි'.
2. උඩරට 2 න ගොඩ සරඹය හඳුන්වන්නේ …………………………..නමිනි.
3. "තත් ජිත් තොං නං තං" මෙය …………………………..ගොඩ සරඹයේ කස්තිරමකි.
4. දේශීය නර්තන සම්ප්‍රදායන් ගණන …………………………..කි.
5. උඩ එල ගත්තත් වට්ටක්කා ……………….මෙම රබන් පදය තාල තබන්නේ මාත්‍රා……………….. තාලයටය
6. හනුමා වන්නමෙන් වර්ණනා කරන්නේ………………………….. විලාශයයි.
7. උඩරට නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශයකි…………………………..
8. පෙරහැරක පළමුවෙන්ම ගමන් කරන්නේ…………………………..ය.
9. දළදා පෙරහැර පවත්වනු ලබන්නේ…………………………..මාසයේදීය.
10. පොරපොල් ගැසීම නම් ජනක්‍රීඩාව…………………………..උත්සවයේදී ජනප්‍රිය අංගයකි. ( 1 × 2)

- නිවැරදි පිළිතුර යා කරන්න

| | | |
|---|---|---|
| 11. සබරගමු නර්තන සම්ප්‍රදාය | - | ජන ක්‍රීඩාවකි |
| 12. ගැට බෙරය | - | 12 කි |
| 13. මේවර කෙළිය | - | සංචාරී චලනයකි |
| 14. ඇවිදීම | - | රත්නපුරය |
| 15. ගොඩ සරඹ | - | උඩරට නර්තන සම්ප්‍රදාය |

( 1 ×2 )

- නිවැරදි පිළිතුර තෝරා ලියන්න

උඩරට නර්තන සම්ප්‍රදායේ 16) ……………….. නටනු ලබන්නේ තම දෙපා 17)……………….. ට සකසා ගැනීමටය. එම සරඹ 18) ………………….. නම් උපකරණය උපයෝගී කර ගනිමින් නර්තනය කරන බැවින් 19) ……………… සරඹ නමින්ද හඳුන්වයි. මෙම සරඹ නර්තනයෙන් පසුව පුහුණු වන්නේ 20) ……………….. යි.

( මණ්ඩිය / ගොඩ සරඹ / දණ්ඩියමේ / පා සරඹ / දණ්ඩික )



ඉස්කෝලේ edulanka.lk

11 කොටස

- ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න

1. දේශීය නර්තන සම්ප්‍රදායන් බිහි වීමට ශාන්ති කර්ම ප්‍රධාන සාධකයකි .
   1. දේශීය නර්තන සම්ප්‍රදායන් තුනේ ප්‍රධාන ශාන්ති කර්ම 3 නම් කරන්න.
   11. එම නර්තන සම්ප්‍රදායන් තුන ප්‍රචලිත ප්‍රදේශ නම් කරන්න.
   111. ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය නම්කර කෙටියෙන් හඳුන්වන්න.
2. ගැමි ජනතාවගේ නිර්මාණශීලිත්වය ගැමි නැටුමෙන් විදහා දැක්වේ.
   1. ඔබ දන්නා ගැමි නැටුම් 5 ක් නම් කරන්න. 11. ඔබ කැමති ගැමි නැටුම් 2 ක නම් ලියන්න.
   111. පෙර කාලයේ ජන ගී ඇති වූ අයුරු කෙටියෙන් විස්තර කරන්න.
3. අප රටේ දේශීය වශයෙන් සංස්කෘතික උත්සව රාශියක් පවත්වනු ලැබේ.
   1. දේශීය සංස්කෘතික උත්සව 5 ක් නම් කරන්න. 11.අවුරුදු උත්සවය හා බැඳි තරඟ ඉසව් 5 ක් නම් කරන්න
   111. එහිදී පවත්වන නර්තනය හා බැඳි අංග 3 ක් නම් කරන්න.
4. 1. ඔබ කැමති රබන් පද 2 ක් ලියන්න. 11. මාත්‍රා 2 තාලයට අයත් රබන් පදයන් ප්‍රස්තාර කරන්න.
5. පහත නම් කරන දෑ රූපයට නගන්න
   1. ගැට බෙරය 2. බංකු රබාන 3. තම්මැට්ටම 4. තාලම්පට
   මෙම රූප වලින් 1 ක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.



www.eduLanka.LK